# ථෙරවාද බුදුදහමේ ප්‍රමාණවාදය

පූජ්‍ය හැගොඩ ඛේමානන්ද නාහිමි

සත්‍යාන්වේෂණය නොහොත් යථාර්ථානුභවය සඳහා උපයෝග කරගතයුතු කරුණු වශයෙන් ඒ ඒ ආචාර්‍යවරයන් විසින් තර්ක න්‍යාය ශාස්ත්‍රයන්හි ප්‍රභින්න ධර්ම විශේෂ රාශියක් නිර්දේශ කර ඇත. ඒවා නන් අයුරින් විග්‍රහකර ඇති අතර, සිද්ධාන්තයන් වශයෙන් යථාභූතඥානය (ඇතිහැටි දැනීම) ලබාගන්නා ක්‍රම හැටියට ඒවාට "ප්‍රමාණය"යි ද, මතාන්තර-විවිධත්වය නිසා "ප්‍රමාණවාදය"යි ද කියනු ලැබේ. බුද්ධපූර්ව සාහිත්‍ය වශයෙන් සැලකෙන වේදයන්හි හා ඇතැම් උපනිෂද් ග්‍රන්ථවල ද ප්‍රමාණවාදයක් පැවැති බවට සාධක එතරම් නැතත් පශ්චාත්බුද්ධ කෘති වූ මෛත්‍රායුපනිෂද්, මුක්තිකොපනිෂද්, තෛත්තරීය, ආරණ්‍යක ආදී උපනිෂද් ග්‍රන්ථවල ද, මනුස්මෘති, චරක, රාමායන, න්‍යායසූත්‍ර ආදී වෙනත් ග්‍රන්ථවල ද, සාංඛ්‍ය ආදී දර්ශන ග්‍රන්ථවල ද, මහායානික දිංනාග, ධර්මකීර්ති, ශංකර ස්වාමි ආදී විද්වතුන්ගේ ග්‍රන්ථවල ද ප්‍රමාණවාදය සවිස්තරව සඳහන්ව ඇත්තේ ය. ප්‍රත්‍යක්ෂ, අනුමාන, ආප්ත (=ශාබ්ද) උපමාන ආදී වශයෙන් ඒවා ප්‍රභින්න ය.

ඓතිහාසික වශයෙන් මුල් බුදුදහම ලෙස සැලකෙන ථෙරවාද පාලි ත්‍රිපිටකයෙහි බුදුරදුන් විසින් ප්‍රමාණවාදය පිළිබඳව ව්‍යවහාර කර තිබෙන ආකාරය සලකා බැලීම මෙහි ලා අදහස් කෙරේ.

I. පුග්ගලපඤ්ඤත්තිප්පකරණයේ:- රූපප්පමාණ, ඝොසප්පමාණ, ලූඛප්පමාණ, ධම්මප්පමාණ යනුවෙන් රූපය ප්‍රමාණකොට ගෙණ ප්‍රසන්න වන, එසේම ඝෝෂය, (හඬ) රූක්ෂ පිළිවෙත, ධර්මය අනුව පැහැදීම් ඇතිකර ගන්නා පුද්ගලයන් සතර දෙනෙකුන් ගැන වදාරා තිබෙන ප්‍රසිද්ධ දහම් පාඨය අනුව, බුදුරදුන් ප්‍රමාණ යන්නෙන් මැනගෙන පුද්ගලයන් නිගමනයන් ලබන හැටිත්, එහෙත් ඒ ප්‍රමාණයන් ඒකාන්තයෙන් සත්‍ය නොවන බවත් දක්වා ඇත.

II. එසේම අඞ්ගුත්තරනිකායේ දසක නිපාතයේ **"මා පුග්ගලෙසු පමාණිකා අහුවත්ථ, මා පුග්ගලෙසු පමාණං ගණ්හිත්ථ"** යන දේශනා පාඨය අනුව පුද්ගලයන් කෙරෙහි ප්‍රාමාණික නොවිය යුතු බවත්, මැනීම් නොකළ යුතු බවත් වදාරා ඇත. පෘථග්ජනයන් අතර ඒකාන්ත දුශ්ශීලයෙකු හෝ ඒකාන්ත ශීලවන්තයෙකු හෝ නොලැබෙන බැවිනි.

III. එහෙත් ආදර්ශයට ගත යුතු - ප්‍රමාණ කොට ගත යුතු - පුද්ගලයන් වශයෙන් ශාරිපුත්‍ර - මෞද්ගල්‍යායන තෙරවරුන් භික්ෂූන් විසින් ගත යුතු බව සංයුක්ත නිකායේ **"එසා භික්ඛවෙ තුලා පමාණං, මම සාවකානං යදිදං සාරිපුත්තමොග්ගල්ලානා"** යන වැකියෙන් දැක්වේ.

IV. එසේ ම ලෝකෝත්තර තත්ත්වයට පත් වූ රහතන් වහන්සේ කිසිවක් ප්‍රමාණ වශයෙන් - මැනීම් වශයෙන් නොගන්නා බව සුත්තනිපාතයේ **"අත්ථඞ්ගතස්ස න පමාණමත්ථි"** යන වචනයෙන් පැහැදිලි වේ.

V. එසේ ම බුදුරජාණන් වහන්සේත්, රහතන් වහන්සේත් කිසිවෙකු විසින් මනිනු ලැබිය හැකි නොවන බවත්, (අප්පමෙය්‍ය බව) මැනිය නොහැකි ගුණයෙන් යුත් බවත් සංයුත්තනිකායේ **"අප්පමෙය්‍යං පමිණන්තො කො'ධ විද්වා විකප්පයෙ, අප්පමෙය්‍යං පමායිනං නිවුතං තං මඤ්ඤෙ පුථුජ්ජනං"** යන ගාථාපාඨවලින් ද අප්පමාණො බුද්ධො යන්නෙන් ද පැහැදිලි වේ.

VI. අඞ්ගුත්තර නිකායේ දසක නිපාතයේ **"තත්‍රානන්ද පමාණිකා පමිණන්ති,....පෙ.....තං හි තෙසං හොති අහිතාය දුක්ඛාය"** යන පාඨයෙන් එයා කියන්නේත් මේකයි. අරයා කියන්නේත් එයමයි, කුමක් නිසා එකක් හොඳ ද? එකක් නරක ද? යි කියමින් ප්‍රාමාණිකයන් මනින බවත්, එය ඔවුන්ට අහිත පිණිස දුක් පිණිස පවතින බවත් වදාරා ඇත.

ප්‍රමාණය ද එක්තරා මානයකි. මානය ක්ලේශයකි. රහත් වූ විට එය සහමුලින් ම නැති වේ. එහෙයින් පුද්ගලයන් ප්‍රමාණ කිරීම ම අසත් නිගමනයන් බව බුද්ධමතය යි. එය සම්‍යක් ඥානයක් නොවේ.

බුදුදහමේ සත්‍ය නිර්ණය කිරීමේ දී සච්ඡිකිරියාව ම පරම නිෂ්ඨාව ලෙස සැලකේ. එනම් නිවණ පසක් කිරීමයි. එය පරම සත්‍යයයි. මනසට විෂය වන්නකි. එහෙත් සම්මුති හෙවත් ව්‍යවහාර වශයෙන් ලෝකයා සත්‍ය වශයෙන් පිළිගන්නා දේ යථාභූත (ඇති හැටි) වශයෙන් දැන ගැනීම ඇස් කන් නාසාදී ඉඳුරන් සයෙන් ම සිදු වන්නේ ය. දර්ශනාන්තරයන්හි **"ප්‍රත්‍යක්ෂ-අනුමාන-ශාබ්ද-උපමාන"** ආදී උපාය මාර්ගවලින් එම දැනීම් ලබන බව උගන්වා ඇති අතර, ඒවා "ප්‍රමාණ" යන නමින් හඳුන්වා ඇත. එහි ප්‍රධාන ඥානෝපාය හෙවත් ප්‍රමාණය "ප්‍රත්‍යක්ෂය"යි. ප්‍රත්‍යක්ෂ - සච්ඡිකිරියා (සාක්ෂාත් කරණය) යන වචන දෙක එක සමාන නොවේ. ඇස් කන් ආදියෙන් ප්‍රත්‍යක්ෂ කිරීම සච්ඡිකිරියාවට ඇතුළත් නොවන බව යට කියන ලදී.

**"පච්චක්ඛ"** (ප්‍රත්‍යක්ෂ) ශබ්දය ත්‍රිපිටක පාලියෙහි යෙදී ඇත්තේ ධම්මසඞ්ගිණියේ සහ සංයුත්තනිකායේ **"අපච්චක්ඛකම්මං"** යනුවෙන් දෙතැනක පමණි. අටුවාවල නම් යෙදී ඇත. සාක්ෂාත් කළහුට ප්‍රමාණයක් නැති බව (යට දැක්වූ පරිදි) බුදුරදුන් වදාරා ඇති බැවින් ප්‍රත්‍යක්ෂය ප්‍රමාණයක් නොවේ. ප්‍රමාණ කර (මැන) බලා දැනගත යුත්තේ අප්‍රත්‍යක්ෂ දෙයකි. එවිට මුල් ම ප්‍රමාණය "අනුමානය" විය යුතු ය. එය බුද්ධ දර්ශනය අනුව ප්‍රමාණයක් නොවෙතත්, න්‍යාය දර්ශන අනුව ප්‍රත්‍යක්ෂය ප්‍රමාණයකැයි කිවයුතු වේ. දැනගත්තේ කෙසේ ද? යන ප්‍රශ්නයට දෙන පිළිතුරක් හැටියට එය (ප්‍රත්‍යක්ෂය) ඥානෝපාය ප්‍රභේදයක් වශයෙන් ප්‍රමාණයකි.

මෙම ලිපියේ ප්‍රස්තුතය "ප්‍රමාණවාදය" නිසා ථෙරවාද ධර්මයේ වොහාර සත්‍යය (සම්මුතිය) පිළිබඳ ව ආර්යයන්ට මෙන් ම පෘථග්ජනයන්ට ද දැනුම් ලබන

ඥානෝපායයන් බුදුන් වදාළ ලෙසින් සැකෙවින් පැහැදිලි කරනු ලැබේ. වෙනත් දර්ශනවල (තර්ක-න්‍යාය) මෙන් ම මෙහි ප්‍රත්‍යක්ෂ-අනුමාන දෙක ප්‍රමාණ වශයෙන් පිළිගෙන ඇති අතර, ඉන්ද්‍රියාර්ථ සන්නිකර්ෂයෙන් (ඉඳුරන් හා අරමුණු ගැටීමෙන්) ඇති වන ප්‍රත්‍යක්ෂඥානය මෙහි **i. දිට්ඨ, ii. සුත, iii. මුත, iv. විඤ්ඤාත** කියා සතර ආකාරයකට බෙදා වදාරා ඇත. එනම්: ඇසින් දුට දේ "දිට්ඨ" යි ද කණින් ඇසූ දේ " සුත" යි ද, නාසය, දිව කය යන තුනෙන් දත් දේ "මුත" යි ද, මනසින් දත් දේ " විඤ්ඤාත" යි ද කියායි.

දෙවන ප්‍රමාණය වශයෙන් අන්‍යයන් දක්වන ලද අනුමාන ඥානය මෙහි (ථෙරවාදයෙහි) **"අන්වයෙඤාණ"** නමින් ප්‍රකාශ වන අතර, ඒ පිළිබඳ වූ ම අනියත ප්‍රමාණ වශයෙන් i.**සද්ධා,** ii.**රුචි,** iii.**අනුස්සව,** iv.**ආකාරපරිවිතක්ක,** v.**දිට්ඨි** vi.**නිජ්ඣානක්ඛමන්ති** යන පස් ආකාර ප්‍රමාණභේදයක් ව්‍යවහාර කර ඇත. වෙනත් න්‍යාය දර්ශනවල එන ශබ්ද (=ආප්ත) උපමාන ආදිය මීට ම ඇතුළත් ව පවතී. පාලි ත්‍රිපිටකයේ (අටුවා හැර) අනුමාන ශබ්දය යෙදී ඇත්තේ විරළ වශයෙන් කීප පළක ය. මජ්ඣිමනිකායේ "අනුමාන" නමින් සූත්‍රයක් ම තිබෙන නමුත් එහි එම වචනය ඇතුළත් ව ඇත්තේ **"අත්තනා'ව අත්තානං අනුමිතිතබ්බං"** යන්නෙහි පමණයි. එහි ද ඇත්තේ යථාර්ථානුභවඥාන ප්‍රමාණයක් වශයෙන් නොව සාමාන්‍යයෙන් අනුන් අනුව තමන් මැන බැලීමේ අදහසකි. එනම්: **"අත්තානං උපමං කත්වා න හනෙය්‍ය"** තමා උපමා කොට අනුන්ට පීඩා නොකළ යුතු බවයි. කෙසේ වෙතත් ප්‍රමාණ විශේෂයක් වශයෙන් අන්‍යයන් දක්වන අනුමානඥානය වෙනත් නම්වලින් ත්‍රිපිටකයෙහි සහ අටුවාවන්හි සඳහන් වේ. යට කී පරිදි **අන්වය – ධම්මන්වය – නයග්ගාහ** ආදී වශයෙනි.

බුදුරදුන් විසින් අනුව දැන ගැනීම (අනුමානය) තර්කය නමින් ද, දේශිත අවස්ථා ඇත. "එක්තරා දේවපුත්‍රයෙකු මා වෙත පැමිණ "ඉදං හි තං ජෙතවනං ඉසිසඞ්ඝනිසෙවිතං" ආදී ගාථා කියූ බව පැවසූ විට, ආනන්ද තෙරුන් විසින් " ඒකාන්තයෙන් ම ඒ අනාථපිණ්ඩික දේව පුත්‍රයා විය යුත්තේ ය. අනාථපිණ්ඩික සිටුවරයා සැරියුත් තෙරුන්ගෙන් බණ අසා ගුණ දැන පැහැදුණේය" යි පවසන ලදී. එවිට බුදුහු **"යාවතකං ඛො ආනන්ද තක්කාය පත්තබ්බං, අනුප්පත්තං තයා"** (තර්කයෙන් දැන ගත යුතු දේ ඔබ දැන ගත්තා.) යි එය නිවැරදි බව වදාළ සේක. ක්ෂීණාශ්‍රවයන් කෙරෙහි ගුණ දැන පැහැදීම ස්වර්ගගාමී පිනක් බව දැනීම මෙහි පූර්ව ප්‍රත්‍යක්ෂය යි. පූර්වප්‍රත්‍යක්ෂයන් අනුව දැන ගැනීම අනුමාන ප්‍රමාණය යි.

බෞද්ධ දර්ශනය ප්‍රත්‍යක්ෂවාදී එකකැ යි කියන බොහෝ විද්වතුන් හුදු " සච්ඡිකිරියාව" ම එහි පවතින එක ම ප්‍රමාණය යි පවසන අතර, මහායාන දාර්ශනික ධර්ම කීර්ති ආචාර්යපාදයන් න්‍යාය බින්දුවේ **ප්‍රත්‍යක්ෂ, අනුමාන** දෙක ම ප්‍රමාණ වශයෙන් ගෙන විස්තර කර ඇත. චතුරාර්ය සත්‍යාවබෝධයෙන් නිර්වාණය සාක්ෂාත් කිරීම බෞද්ධ පරමාර්ථය බැවින් එහි කළහුට ප්‍රමාණයක් නැති බව අත්ථඞ්ගතස්ස න පමාණමත්ථි යන බුද්ධවචනයෙන් ඔප්පු වන බැවින් දැනුම් (ඥෙයධර්ම) ලැබීමට ප්‍රමාණ ඇතත්, එනම් ප්‍රත්‍යක්ෂ අනුමාන දෙකෙන් සම්‍යග්ඥාන ලබතත් ආර්යයා- විශේෂයෙන් බුදුරජාණන් වහන්සේ (අප්පමාණො බුද්ධො) යි ප්‍රමාණවාදයට හසු නොවන බවත්, " අප්පමෙය්‍ය" හෙවත් අනුන් විසින් නොමැනිය හැකි බවත් සැලකිය යුත්තේ ය.

විද්‍යෝදය

ධර්මශාස්ත්‍රීය සඞ්ග්‍රහය

මහගොඩ ශ්‍රී ඥානේශ්වර නාහිමි උපහාර කලාපය

1995

පිටු, 13-15



*Typed by - Rev, Maturata Pannananda, Vidyodaya Pirivena, Colombo-10*